**ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව - 2022**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10 ප්‍රකාරව සභාවේ සියලුම ලියාපදිංචි ගාස්තු ආදායම් උපචිත පදනම මත හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණු අතර ලැබිය යුතු ලියාපදිංචි ගාස්තු ලෙස ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙන් (IESL) ලැබිය යුතු රු. 845,000ක් පමණක් දක්වා තිබුණි. සභාවේ සාමාජිකයින් ලෙස ලියාපදිංචිකළ යුතු වූ, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) හා ශ්‍රී ලංකා සංස්ථාපිත ඉංජිනේරු ආයතනයේ (IIESL) ලියාපදිංචි සාමාජිකයින් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් දක්වා තිබුණු රු.18,434,000ක ලියාපදිංචි ගාස්තු ආදායම සතුටුදායක ලෙස පරීක්‍ෂා කළ නොහැකි විය. | සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනයන්හි ලැබිය යුතු ලියාපදිංචි ගාස්තු ලෙස ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙන් ලැබිය යුතු රු. 845,000 ක් පමණක් පෙන්වා ඇත්තේ අනෙකුත් ආයතනවලින් ලැබිය යුතු මුදල් ඒ වන විට ලැබී තිබුණු බැවිනි. ඉංජිනේරු සභාවේ ලියාපදිංචි වීම නීතිමය අවශ්‍යතාවයක් නොවන බැවින් ඒ සඳහා යොමු කිරීමට සභාවට හැකියාවක් නැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10 හි සඳහන් නියමයන්ට අනුකූලව ආදායම් උපචිත පදනමට හඳුනාගත යුතුය. සාමාජික ලියාපදිංචිය තහවුරු කර ගැනීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 14 හි 34 ඡේදය ප්‍රකාරව සභාව විසින් සම්බන්ධිත පාර්ශවයන් වෙත ගෙවන ලද පාරිශ්‍රමික හා අනෙකුත් දීමනා පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 14 හි 34 ඡේදය ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 14 හි නියමයන්ට අනුකූලව අවශ්‍ය හෙළිදරවු කිරීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 15 හි 14 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍ය වටිනාකම් අතර සැසඳීමක් ඇතුළත් කර හෝ අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍ය වටිනාකම් අතර වන ප්‍රමාණාත්මක වෙනස්කම් සඳහා හේතු පැහැදිලි කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා අයවැය ලේඛනය සකස් කිරීම ප්‍රමාද වූ බැවින් ඒ සඳහා අනුමැතියක් ලබාගැනීමට නොහැකි විය. අනුමත අයවැය ලේඛනයක් නොතිබුණු බැවින් මෙම ක්‍රියාදාමය සිදු කිරීමට නොහැකි විය. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 15 හි සඳහන් නියමයන්ට අනුකූලව අයවැයගත තොරතුරු හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | සභාවට එරෙහිව බාහිර පාර්ශව විසින් පවරා තිබුණු නඩුකර නවය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 8 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 8 ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. කෙසේ වෙතත් මෙම නඩුවලට අදාළව කිසිම වන්දි මුදලක් සභාවට ගෙවීමට සිදු නොවේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 8 හි සඳහන් නියමයන්ට අනුකූලව අසම්භාව්‍ය වගකීම් හෙළිදරවු කළ යුතුය. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ අවශ්‍යතාවය ප්‍රකාරව සේවක පාරිතෝෂික බැඳියාව වෙනුවෙන් ප්‍රතිපාදන සිදුකර නොතිබුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩුව මඟ හරවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | සේවක පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන සිදු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළව 2023 වර්ෂය තුළ ගෙවා තිබුණු දුරකථන ගාස්තු හා ප්‍රසාද දීමනා එකතුව රු.76,416ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ගෙවිය යුතු ශේෂ ලෙස දක්වා නොතිබුණි. | 2022 දෙසැම්බර් මාසයට අදාළ දුරකතන බිල්පත් ලැබුණේ 2023 ජනවාරි මාසයේදීය. ප්‍රසාද දීමනා ගෙවීම සඳහා සභාවේ අනුමැතිය හිමි වූයේ 2023 ජනවාරි සභා රැස්වීමේදීය. එම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ගෙවිය යුතු වටිනාකම් යටතේ ඒවා දැක්වීමට නොහැකි විය. | වර්ෂයට අදාළ සියලු වියදම් හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2017 අංක 04 දරන ශ්‍රී ලංකා ඉංජිනේරු වරුන්ගේ සභාවේ පනත | | | |
| (i) 12(ඇ) වගන්තිය | ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය වැරදි හැසිරීම්වලට අදාළ කාරණා පිළිබඳව පරීක්ෂණ පැවැත්විය යුතු වුවද ඉංජිනේරු වෘත්තියේ නියැලෙන වෘත්තිකයන් විසින් අනුගමනය කළ යුතු බවට හඳුන්වා දී තිබුණු වෘත්තීය ආචාරධර්ම පද්ධතිය අනුව ඉංජිනේරුවන් විසින් කටයුතු සිදු කරන්නේද යන්න පිළිබඳ පරික්ෂා කර නොතිබුණි. | ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය වැරදි හැසිරීම්වලට අදාළව ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය නීතිරීති ගැසට් කර ඇත. මේ වන විට ඒ සඳහා අවශ්‍ය වන අභ්‍යන්තර ක්‍රියාදාමය සකස් කරමින් පවතී. | ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ පනතේ විධිවිධානයන්ට අනුව ඉංජිනේරු වෘත්තිකයන්ගේ වෘත්තීය වැරදි හැසිරීම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |
| (ii) 14(1) වගන්තිය | ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ ලියාපදිංචි වී ඇත්නම් මිස වෘත්තිකයින් ඉංජිනේරු වෘත්තිය සම්බන්ධ කටයුතුවල නියැලීම සිදු නොකළ යුතුය. සමාලෝචිත වර්ෂය අවසානයට ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ (IESL) හා ශ්‍රී ලංකා සංස්ථාපිත ඉංජිනේරු ආයතනයේ (IIESL) වෘත්තිකයින් පිළිවෙලින් 19,825ක් හා 5,956ක් වශයෙන් 25,781 ක් ලියාපදිංචි වී තිබුණද ඉංජිනේරු සභාවේ වෘත්තිකයින් 17,680 දෙනෙකු පමණක් ලියාපදිංචි වී තිබුණි. ඒ අනුව ඉංජිනේරු | ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව පනතේ 15(1) හා (2) වගන්ති අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) හා ශ්‍රී ලංකා සංස්ථාපිත ඉංජිනේරු ආයතනයේ (IIESL) සාමාජිකත්වය දරන, සුදුසුකම් සපුරා ඇති අයට ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචි වීමට ඉල්ලුම් කළ හැකිය. පනතේ අංක 14(1) හා (2) වගන්ති අනුව සභාවේ ලියාපදිංචි වීම අවශ්‍ය වන්නේ ඉංජිනේරු වෘත්තිය සම්බන්ධ කටයුතුවල නියැලී සිටින අය පමණක් බැවින් එවැනි කටයුතුවල නියැලී නොසිටින IESL හා IIESL සාමාජිකයන් සභාවේ ලියාපදිංචි වීම | ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ පනතේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වෘත්තිකයින් 8,100කට අධික සංඛ්‍යාවක් ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ සභාවේ ලියාපදිංචි වීමකින් තොරව ඉංජිනේරු වෘත්තියේ නියැලෙන නමුත් එම පුද්ගලයින් හදුනා ගැනීමට හැකි යාන්ත්‍රනයක් සකස් කර ක්‍රියාත්මක කිරීමට හා ඊට අදාළ සම්බන්ධිත පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නීතිමය අවශ්‍යතාවයක් නොවන නිසා ඒ සඳහා යොමු කිරීමට සභාවට හැකියාවක් නැත. එසේ වුවද 2022 වසර තුළ කිහිප වතාවකදීම සාමාජිකත්වය දැනුවත් කිරීම හා සිහිකැඳවීම් කිරීමට IESL හා IIESL ආයතනවලට උපදෙස් දී තිබේ. තවද යම් ඉංජිනේරු වෘත්තිකයකුගෙන් සේවාවන් ලබා ගැනීමේදී මහජනයා හට ඒ පිළිබඳව දැන ගැනීමට පහසුකම් සභාවේ නිල වෙබ් අඩවිය (www.ecsl.gov.lk) මගින් සලසා දී ඇත. | |
| (ආ) | 1985 අංක 01 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතේ 09(2) වගන්තිය | සභාව විසින් අරමුදලට දායක මුදල් ගෙවීමේදී ඉපයීම් ගණනය කිරීම සඳහා සේවකයින්ගේ ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනා, දුරකථන දීමනා, වෘත්තීය දීමනා හා විශේෂ දීමනා අදාළ කරගෙන තිබීම හේතුවෙන් අදාළ දීමනා වලින් සියයට 15 බැගින් සභාවේ දායක මුදල් ලෙස වැඩිපුර ගෙවා තිබුණු අතර සියයට10 බැගින් සේවකයාගේ දායකය වැඩිපුර අයකරගෙන ගෙවා තිබුණි. | 1985 අංක 01 දරණ සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතේ 47 වගන්තියට අනුව අරමුදලට දායක මුදල් ගෙවීමේදී ඉපයීම ගණනය කිරීම සඳහා වැටුප සලකන අතර රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුව ප්‍රවාහන දීමනාව ඉන්ධන දීමනාව හා දුරකථන දීමනාව වැටුපට එක්කර ගෙවිය හැකිය. මීට අමතරව වෘත්තීය දීමනාව සහ රු. 5,000 දීමනාවද මාසික වැටුපට එකතු කර ගෙවනු ලබයි. මේ නිසා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවීමේදී ඉපයීම් ගණනය කිරීම සඳහා මෙම දීමනා සලකා බලන ලදී. | සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතේ 09(2) වගන්තියෙහි සඳහන් නියමයන්ට අනුකූලව දායක මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 44 වන වගන්තිය | සභාව විසින් අරමුදලට දායක මුදල් ගෙවීමේදී පාරිශ්‍රමිකය ගණනය කිරීම සඳහා ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනා, දුරකථන දීමනා, වෘත්තීය දීමනා හා විශේෂ දීමනා අදාළ කර ගැනීම හේතුවෙන් අදාළ දීමනා වලින් සියයට 3 බැගින් වැඩිපුර ගෙවා තිබුණි. | 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනතේ 44 වගන්තියට අනුව අරමුදලට දායක මුදල් ගෙවීමේදී ඉපයීම ගණනය කිරීම සඳහා වැටුප සලකන අතර රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුව ප්‍රවාහන දීමනාව ඉන්ධන දීමනාව සහ දුරකථන දීමනාව වැටුපට එක්කර ගෙවිය හැකිය. මීට අමතරව වෘත්තීය දීමනාව සහ රු.5,000 දීමනාවද මාසික වැටුපට එකතු කර ගෙවනු ලබයි. මේ නිසා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක මුදල් ගෙවීමේදී ඉපයීම් ගණනය කිරීම සඳහා මෙම දීමනා සලකා බලන ලදී. | 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පනතේ 44 වගන්තිය සඳහන් නියමයන්ට අනුකූලව දායක මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 10.1 උප වගන්තිය. | නිවසේ සිට රාජකාරි ඉටුකිරීමේදී රාජකාරි කළ කාලය හා ඉටුකළ රාජකාරි පිළිබඳව තහවුරු කර ගත නොහැකි බැවින් අතිකාල හෝ සමාන දීමනා නොගෙවිය යුතු වුවත් 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා සති අන්ත හා රජයේ නිවාඩු දින 95 ක් නිවසේ සිට රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරිනියට වැටුපෙන් 1/20 ක් බැගින් වන පරිදි එකතුව රු.254,503ක් නිවාඩු දින වැටුප් ලෙස සහ රු.45,810 ක් සේවක අර්ථ සාධක අරමුදල් දායකය හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකය ලෙස ගෙවා තිබුණි. | 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා තොරතුරු තාක්ෂණ නිලධාරිනිය වෙත ලබාදී ඇති නිවාඩු දින වැටුප් සඵලදායි කාර්යභාරයක් සභාපතිතුමාගේ අධීක්ෂණය යටතේ සිදු කිරීමෙන් පසු ගෙවීම් සිදුකර තිබේ. සේවකයන්ගේ කාර්ය සාධනය මනිනු ලබන්නේ ඔවුන් සිදුකරනු ලබන කාර්ය ප්‍රමාණයෙනි. එම නිසා බොහෝ වැඩකටයුතු සේවකයන් ඉන්නා ස්ථානය මත රඳා නොපවතින ලෙස තාක්ෂණය භාවිත කරමින් සිදුකර ඇත. | ආයතන සංග්‍රහයේ සඳහන් නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. සාවද්‍ය ගෙවීම් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | | | |
|---|---|---|---|---|
| (i) | මු. රෙ. 137 | සභාවේ ගෙවීම් වවුචර්පත් අනුමත කර නොතිබුණි. | ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ වැඩ කටයුතු කාර්යක්ෂම ලෙස හා අවම සම්පත් ප්‍රමාණයක් උපයෝගී කරගෙන ඉටුකිරීම සඳහා කාලයට අනුරූප වන පරිදි සියලුම ගෙවීම් විස්තර ඇතුළත් ගෙවීම් වවුචර පිළියෙළ කර ඇත. | මු.රෙ. 137 හි ප්‍රකාරව වවුචර් පත් අනුමත කළ යුතුය. |
| (ii) | මු.රෙ.225(1) හා (2) | ගෙවීම් සඳහා ඉදිරිපත් කරන වවුචර් නියමිත ආකෘති පත්‍රවල නිවැරදි ලෙසත් සම්පූර්ණ ලෙසත් පිළියෙල කළ යුතු වුවද සභාවේ වැටුප් හා අතිකාල ගෙවීම් සඳහා භාවිතාකර තිබුණු වවුචර් පත් පිළිවෙලින් පොදු 33 හා පොදු 35(අ) ආකෘතියෙන් බැහැරව සකස්කර තිබුණි. | අතිකාල සහ වැටුප් සඳහා අවශ්‍ය වන සියලුම විස්තර සහ අනුමැතීන් ආයතනයේ අභ්‍යන්තර ක්‍රමවේදයක් මගින් ක්‍රියාත්මක වේ. එහිදී කාර්යක්ෂම ලෙස කාලයට අනුරූප වන පරිදි අතිකාල සහ වැටුප් වවුචර පිළියෙළ කර ඇත. | මු.රෙ. 225(1) හා (2) හි සඳහන් නියමයන්ට අනුකූලව වවුචර්පත් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) | මු. රෙ. 264 | ගෙවීම් වවුචර් 20 කට අයත් වටිනාකම රු.531,805 ක් සඳහා කුවිතාන්සිපත් ලබාගෙන නොතිබුණි. | පිටස්තර පුද්ගලයින් සහ ආයතන සඳහා සභාව විසින් කරන ගෙවීම් වලට කුවිතාන්සි ලබාගෙන ඇත. අනෙකුත් අභ්‍යන්තර ගෙවීම් සඳහා මේ වනවිටත් සුදුසු වැඩපිළිවෙලක් සකස් කර ඇත. | මු.රෙ. 264 හි සඳහන් නියමයන්ට අනුකූලව කුවිතාන්සි ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) | රාජ්‍ය ව්‍යවසායන්හි සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් අදාළ ආයතන වෙත ඉදිරිපත් කර ඇති අතර මෙය අඛණ්ඩව කිරීමට බලාපොරොත්තු වේ. | චක්‍රලේඛ විධි විධානයන්ට අනුව අයවැය පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | ඉදිරියේදී කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධි විධානයන්ට අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 6,885,000 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 10,550,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,665,000ක පිරිහීමක් නිරීක්ෂණය විය. සභාවේ පොලී ආදායම රු. 2,684,000 කින් වැඩි වී තිබුණද වැටුප් හා වේතන සහ නීති ගාස්තු වියදම් පිළිවෙලින් රු. 2,455,000 කින්, හා රු. 3,875,000 කින් ඉහළ යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවක අර්ථසාධක අරමුදල් දායකය ඊළඟ මාසය අවසන් වීමට පෙර අරමුදල වෙත ගෙවිය යුතු වුවත් සභාවේ සේවයේ නියුතු නිලධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් 2019 ඔක්තෝබර් සිට 2020 දෙසැම්බර් දක්වා වූ කාලය වෙනුවෙන් ගෙවිය යුතුව තිබුණු සේවක අර්ථසාධක අරමුදල් දායකය නියමිත දිනට පෙර නොගෙවීම හේතුවෙන් රු.179,838ක අධිභාරයක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. | ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ වැඩකටයුතු ආරම්භ කළේ 2018 අගෝස්තු මාසයේ වන අතර ඒ සඳහා කාර්යාලයක් ලැබුනේ 2019 සැප්තැම්බර් මාසයේදීය. එහිදී සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීමට 2019 ඔක්තෝබර් මාසයේදී තාවකාලිකව නිලධාරීන් දෙදෙනෙකු පත් කර ගන්නා ලද අතර එම සේවකයින් දෙදෙනාට සේවක අර්ථ සාධක අරමුදල් නොගෙවන ලද බැවින් දායක මුදල් ගෙවීමේදී අර්ථසාධක අරමුදල් මණ්ඩලය මගින් | සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධි විධානයන්ට අනුව දායක මුදල් නියමිත කාලය තුළ ගෙවීමට වගබලා ගත යුතුය. |

රු.179,838 ක අධිභාරයක් ගෙවිය යුතු බව දන්වන ලදී. එම අධිභාරය සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලදී.

### 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටිය අනුව HM 1-3 වැටුප් කේතය යටතේ වන ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුර සඳහා MM මට්ටමේ තනතුරක වසර 5ක පළපුරුද්දක් අවශ්‍ය වුවද එම මට්ටමේ වසරක සුදුසු කම් සපුරා තිබුණු MM 1-1 වැටුප් කේතය යටතේ ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුර දැරූ නිලධාරිණිය HM 1-3 වැටුප් කේතය යටතේ ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුරේ රාජකාරි ඉටුකිරිම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 නොවැම්බර් 28 දින පත්කර තිබුණි. ඒ සඳහා රාජකාරි ඉටු කිරිමේ දීමනා, සේවක අර්ථ සාධක අරමුදලේ දායකය හා සේවක භාරකාර අරමුදලේ දායකය ලෙස පිළිවෙලින් රු.391,184 ක්, රු.58,678 ක් හා රු.11,736 ක් වශයෙන් රු. 461,598 ක් ගෙවා තිබුණි. තවද 2022 ජනවාරි 14 දිනැති අංක 01/2015(ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව වැටුප් කේත අංක MM 1-1 යටතේ වන තනතුරක් දැරූ ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරිනියට 2022 ජනවාරි සිට ජුනි දක්වා රු. 40,000 බැගින් හා 2022 ජූලි සිට දෙසැම්බර් දක්වා රු. 50,000 වන පරිදි රු. 540,000 ක ප්‍රවාහන දීමනාවක් හා රු.42,550 බැගින් රු. 263,804 ක් වූ ඉන්ධන | 2022 ජුනි 27 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය මගින් ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුර MM 1-1 සිට HM 1-3 දක්වා ඉහළ නංවන ලද අතර එය අන්තර්ග්‍රහණය කිරීම සඳහා උපදෙස් දී තිබුණි. ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරී තනතුර HM 1-3 වැටුප් කේතයට පරිවර්තනය කර තිබූ නමුත් දැනට එහි සේවය කරනු ලබන්නේ MM 1-1 වැටුප් කේතයට අයත් නිලධාරිනියෙකි. එම නිලධාරිනිය HM 1-3 වැටුප් කේතයට අවශ්‍ය සියලුම අධ්‍යාපන සුදුසුකම් ද ඊට අතිරේකව වෘත්තීය සුදුසුකම්ද සපුරා තිබූ නමුත් අවශ්‍ය අවුරුදු 15 ක පළපුරුද්ද සම්පූර්ණ කර නොමැති නිසා අන්තර්ග්‍රහණය කිරීම කළ නොහැකිය. කෙසේ වුවද එම නිලධාරිනිය විසින් HM 1-3 වැටුප් කේතයට අදාල සභාවේ කාර්යභාරයන් ඉතා කාර්යක්ෂම සිදු කරමින් පවතී.<br><br>ඒ අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු සභා පනතේ 22 වන වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරිනිය ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13:5 වගන්තිය ප්‍රකාරව HM 1-3 වැටුප් කේතයට අදාළ වැඩ බැලීම "රාජකාරි ඉටු කිරීමක්" ලෙස පත්කිරීමට සභාව මගින් තීරණය කරන ලදී.<br><br>එයට අදාළ පාරිශ්‍රමිකය ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12:3, 12:5:1 යන වගන්තිවලට අනුව ගණනය කර ගෙවා ඇති අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1589/30 දරණ 2009 පෙබරවාරි 20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ IX වෙනි පරිච්ඡේදයේ 119 වන වගන්තියට අනුව HM 1-3 තනතුරෙහි රාජකාරි කටයුතු ඉටුකිරීමට අවශ්‍ය නිල | කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝග අනුව කටයුතු කළ යුතුය. සාවද්‍ය ලෙස සිදුකළ ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දීමනාවක් ගෙවා තිබුණි. | වශයෙන් හිමි දීමනාද ගෙවන ලද අතර ඒවාට අදාළ සේවක අර්ථසාධක අරමුදල් දායකය සහ සේවක භාරකාර අරමුදල් දායකයද ගෙවන ලදී. | |
| (ආ) | සේවක අර්ථ සාධක අරමුදල සඳහා නිලධාරීයාගෙන් සියයට 10ක් හා සභාවෙන් සියයට 15ක් වශයෙන් දායක මුදල් ගෙවා තිබුනද ඒ සඳහා 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 11 වගන්තිය ප්‍රකාරව සේවක අර්ථසාධක අරමුල් මණ්ඩලයෙන් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. අරමුදල සඳහා වූ සභාවේ දායකත්වය සියයට 15 ක් වූවද මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 6.1 හි එය සියයට 12 ක් ලෙස දක්වා තිබුණි. | නිලධාරීයාගෙන් 10% ක් හා සභාවෙන් 15% ක් වශයෙන් සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවීමට ශ්‍රී ලංකා ඉංජිනේරු සභා පනතේ 22(2)(ඈ) වගන්තියට අනුව සභාව මගින් තීරණය කරන ලද අතර සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 11 වන වගන්තියට අනුව නිලධාරීන්ගෙන් 10% ක් හා සභාවෙන් 15% ක් වශයෙන් දායක මුදල් ගෙවන බව සේවක අර්ථ සාධක මණ්ඩලය වෙත දැනුම් දීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 11 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |